# කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය
# தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சு
# Ministry of Labour and Foreign Employment

හයවන මහල, "මෙහෙවර පියෙස", නාරාහේන්පිට, කොළඹ 05, ශ්‍රී ලංකාව.
6 ஆவது தளம், "மெஹெவர பியெச", நாரஹேன்பிட்டி, கொழும்பு 05, இலங்கை.
6th Floor, " Mehewara Piyesa", Narahenpita, Colombo 05, Sri Lanka.

| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No. | MFE/DEV/HOB/03/vol ii | ඔබේ අංකය<br>உமது இல<br>Your No. | | දිනය<br>திகதி<br>Date | 2022.09. 16 |

අමාත්‍යාංශ චක්‍රලේඛ අංක : **02/2022 (ii)**

**එතෙර රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන්හට පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට බලපත්‍ර ලබා දීමේ යෝජනා ක්‍රමය**

පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීම සඳහා එතෙර රැකියා වල නියුතු ශ්‍රී ලාංකිකයන් හට බලපත්‍ර ලබා දීමට අදාලව 2022.08.31 දින නිකුත් කරනු ලැබූ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශ අංක 02/2022 චක්‍රලේඛයට ගෙන එන ලද 2022.09.09 දිනැති අංක 02/2022 (i) දරණ සංශෝධිත චක්‍රලේඛයට අමතරව 2022.08.31 දිනැති අංක 02/2022 චක්‍රලේඛය පහත පරිදි වැඩිදුරටත් සංශෝධනය කරනු ලැබේ.

**වගන්තිය 4 -කොන්දේසි**

**(1)** මෙහි **4.3** උප වගන්තිය අවසානයෙහි පහත යෙදුමද ඇතුලත් කරනු ලැබේ.
"ශ්‍රී ලංකාවේ ලියාපදිංචි බලයලත් නියෝජිතවරයෙකුට/නිෂ්පාදකයාගේ බලයලත් බෙදාහරින්නෙකුට නිදර්ශනය කිරීම/ප්‍රදර්ශනය කිරීම යන කාරණය සඳහා පමණක් නියැදියක් වශයෙන් එකිනෙකට වෙනස් මාදිලි තුනකට අයත් පාවිච්චි නොකල පූර්ණ විද්‍යුත් වාහන 3ක් බලයලත් නියෝජිතවරයාගේ/නිෂ්පාදකයාගේ බලයලත් බෙදාහරින්නෙකුගේ නමින් පමණක් ලියාපදිංචි කර ආනයනය කිරීමට අවසර දෙනු ලබන අතර එකී වාහන වසර 5ක් යන තෙක් වෙනත් පාර්ශවයකට පැවරිය නොහැක".

**(2)** මෙහි **4.4** උප වගන්තියේ ඇතුලත් HS කේත වෙනුවට පහත HS කේත ඇතුළත් කරනු ලැබේ.

| ප්‍රේෂණ වල වටිනාකම (ඇ.ඩො.) | වාහන වර්ගය | හිමිකම ලැබීමට අදාල ප්‍රේෂණය කරන කාලසීමාව හා වාහනයේ CIF වටිනාකම |
|---|---|---|
| 3,000 හෝ ඊට වැඩි | රෝද දෙකක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන<br>8711.60.10 | 2022 මැයි 01 දින සිට 2023 අප්‍රේල් 30 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය වටිනාකමෙන් 50% ට අඩු හෝ සමාන CIF වටිනාකමකින් යුත් වාහන |
| 20,000 හෝ ඊට වැඩි | රෝද හතරක් සහිත, විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන<br>8702.40.19 , 8702.40.39 , 8702.40.59<br>8703.80.31, 8703.80.32, 8703.80.33<br>8703.80.34, 8704.90.31, 8704.90.32<br>8704.90.33, 8704.90.34 | 2022 මැයි 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින හෝ ඊට පළමුව වාහන බලපත්‍රය ඉල්ලුම් කරන දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය වටිනාකමෙන් 50% ට අඩු හෝ සමාන CIF වටිනාකමකින් යුත් වාහන |

ආර්.පි .ඒ. විමලවීර
ලේකම්
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය